වාර්ෂික වාර්තාව
2020

Ethics Excellence Education

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

පටුන

	පිටු අංක
දැක්ම හා මෙහෙවර	02
හැඳින්වීම	03
ආයතනික තොරතුරු	04
සටහන	05
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ ජාතික වගකීම	05
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන්	05
ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම්	06
සභාපතිතුමාගේ පණිවිඩය	07
සංවිධාන ව්‍යුහය	08
කාර්ය මණ්ඩලය	08
සභාවේ සාමාජිකයන් පිළිබඳ කෙටි සටහන	09
සම්පූර්ණ කරන ලද සහ දැනට සිදු කෙරෙමින් පවතින කාර්යයන්	11

සම්පූර්ණ කරණ ලද කාර්යයන්

- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම
- සභා රැස්වීම්
- සහතික නිකුත් කිරීම
- දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම
- වෙබ් අඩවිය නවීකරණය කිරීම
- දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම
- වෙනත් සංවිධාන සමඟ පැවැත්වූ රැස්වීම්

දැනට සිදු කෙරෙමින් පවතින කාර්යයන්

- ඉතිරි නීති සහ රෙගුලාසි සකස් කිරීම
- ඉංජිනේරු කාර්මිකයින් ලියාපදිංචිය සඳහා ක්‍රියාවලිය සකස් කිරීම

මූල්‍ය ප්‍රකාශන	13
විගණන වාර්තාව	20

දැක්ම

ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සහ රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකයෙකු වීම.

මෙහෙවර

ජාත්‍යන්තරව පිළිගත් සහ දේශීය වශයෙන් අදාළ ප්‍රමිති නිපුණතාවය සහ රටේ සංවර්ධනය සඳහා වෘත්තිය සඳහා කැපවීම පවත්වා ගනිමින් නීතියෙන් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන්ගේ විවිධ කාණ්ඩ ලියාපදිංචි කරවීම.

හැඳින්වීම

2017 මාර්තු 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ II කොටසට අතිරේකයක් වශයෙන් පළ කරන ලද 2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත.

මෙම පනත මගින්,

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද
- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද
- ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

පනත අනුව සියළුම ඉංජිනේරු වෘත්තීකයන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි විය යුතුය. පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි ඉංජිනේරු වෘත්තිකයන් අයත් වන කාණ්ඩ

- වරලත් ඉංජිනේරු
- ආශ්‍රිත ඉංජිනේරු
- අනුබද්ධ ඉංජිනේරු
- සංස්ථාගත ඉංජිනේරු
- ඉංජිනේරු ඩිප්ලෝමාධාරී
- ඉංජිනේරු කාර්මික

ශ්‍රී ලංකාව තුල සේවයේ යෙදෙන විදේශීය ඉංජිනේරු වෘත්තියකයින්, මාස හතරක කාල සීමාවක් සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව වෙත පැවරී තිබේ. එම ලියාපදිංචි කාලසීමාව අවසානයේදී නැවත අලුත් කළ හැකි වන්නේය.

ආයතනික තොරතුරු

සංවිධානයේ නම
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

නෛතික ස්වරූපය
රජයට අයත් නියාමන ආයතනයකි.

ස්ථාපනය කරන ලද වසර
2017 අංක 4 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2017 වසරේ දී

රේඛීය අමාත්‍යාංශය
වාරිමාර්ග අමාත්‍යාංශය

ආරම්භ කල දිනය
2018 අගෝස්තු 24

නීති උපදේශක
රුවනි හපුආරච්චි මහත්මිය

ප්‍රධාන කාර්යාලය
4 වන මහල, වාරිමාර්ග දෙපාර්තමේන්තු පරිශ්‍රය
230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය - 0112588811
ඊ මේල් - registrar@ecsl.lk
Web site – www.ecsl.lk

බැංකු කරුවන්
ලංකා බැංකුව

බදු හඳුනා ගැනීමේ අංකය
10276922802192003

පනත අනුව පාර්ශවකරුවන්
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

සටහන

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ එහි ජාතික වගකීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ස්ථාපිත කිරීම මවුබිමේ ගෞරවණීය ඉංජිනේරු වෘත්තීය සඳහා වූ පෙර නොවූ විරූ සුවිශේෂී සන්ධිස්ථානයක් විය. එය ප්‍රාග් ඓතිහාසික යුගවල සහස්‍ර කිහිපයක් දක්වා විහිදෙන ප්‍රත්‍යක්ෂ මූලයන්ගෙන් සමන්විතය. කලක සිට ලොව පුරා ඉංජිනේරු වෘත්තියේ සමකාලීන සමස්ථිතික අභිලාශයන් අනෙකුත් දියුණු ජාතීන් ක්‍රියාවට නංවන ආකාරයටම සංවිධානාත්මකව නියාමන මෙන්ම නියෝජන ජාතික ආයතනයක් ස්ථාපනය කිරීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව සිහි ගන්වමින් ශ්‍රී ලාංකීය ඉංජිනේරු වෘත්තීය කෙරෙහි පූර්ණ අවධානය යොමු කරමින් සිටියි.

පාර්ශවකරුවන් අතර සහ ජාතික නායකත්වය සමඟ දීර්ඝ කාලීන සාකච්ඡා සහ විවිධ අවස්ථාවල දී පැවති රජයන්ගෙන් ලැබුණු යහපත් අනුග්‍රාහක දායකත්වය යන කරුණු සියල්ල අවසනයේ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පාර්ලිමෙන්තු පනතක් මගින් අවශ්‍ය නෛතික බලය ලබා දීම සිදු කර ඇත.

එසේ ස්ථාපනය කරණ ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව ඉංජිනේරු වෘත්තිය නියාමනය කිරීම සඳහා ඉහලම ආයතනය බවට පත් වෙමින් ජාතික නායකත්ව සැපයීමේ සුවිසල් වගකීම එදින සිටම පැවරී ඇත. කෙටියෙන් සඳහන් කරනවා නම්, පිළිගත් සුදුසුකම් දරන්නා වූ ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම එම වෘත්තිකයන්ගේ යම් වෘත්තිමය විශමාචාර ක්‍රියාවන් පිළිබඳ විමර්ෂන සිදු කිරීම සහ ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියේ යෙදීමට අදාල කාරනා පිළිබඳව රජය සහ අනෙකුත් ආයතනවල නියෝජනයන් සිදු කිරීම සඳහා එම ආයතනයට නෛතික බලය පැවරී ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ කාර්යයන්

පහත සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලැබ ඇත.

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය තත්වයන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය චර්යාවන් පවත්වාගෙන යාම.
- ඉංජිනේරු වෘත්තිකයන් කාණ්ඩ 06 ක් යටතේ ලියාපදිංචි කිරීම.
- ශ්‍රී ලංකාව තුල ඉංජිනේරු වෘත්තියෙහි නියලීමට අදාල කාරනා පිළිබඳ රජය සහ අදාල ආයතනන්හි නියෝජනයන් සිදු කිරීම.
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලියාපදිංචි ලේඛන පවත්වාගෙන යාම.
- ලියාපදිංචි කරන ලද ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලැයිස්තුව වරින් වර ප්‍රසිද්ධ කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම.
- සභාවේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වේතන නිර්ණය කිරීම
- ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු නිර්ණය කිරීම

- ලියාපදිංචි සහතික නිකුත් කිරීම
- ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මක භාවය ඉහල නැංවීමට අවශ්‍ය වන වෙනත් යම් කවර වූ කාරණයක්.
- ඊට සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම

ඉංජිනේරු වෘත්තිකයන් අයත් කාණ්ඩ සහ සුදුසුකම්

(2017 අංක 4 දරණ ඉංජිනේරුවන්ගේ සභාව පනතේ 15 වන වගන්තියේ 'අ' උපලේඛනය අනුව)

වරලත් ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරළත් ඉංජිනේරුවරයෙකු වීම.

ආශ්‍රිත ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර හතරක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය හෝ 1968 අංක 17 ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වීම.

අනුබද්ධ ඉංජිනේරු

1968 අංක 17 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර තුනක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

සංස්ථාගත ඉංජිනේරු

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනයේ සංස්ථාපිත ඉංජිනේරුවරයෙකු වීම.

ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්

1992 අංක 64 දරණ ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිළිගත්, පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණ විද්‍යා ආයතනයෙන් ඉංජිනේරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

ඉංජිනේරු කාර්මික

(i) 1990 අංක 20 දරණ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ ඉංජිනේරු 4 වන මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level 4) හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම.

(ii) ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ වසර එකක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර එකක කාර්මික පලපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ තාක්ෂණික හෝ තාක්ෂණ විද්‍යා ආයතනයකින් තාක්ෂණ විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් දරන්නෙකු වීම.

සභාපතිතුමාගේ පණිවිඩය

තිලක් ද සිල්වා

BSc Eng., MSc, CEng (SL), CEng (UK), CITP (UK), FIE (SL), FIET (UK), FBCS (UK), SMIEEE (USA),MCS (SL)

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) 2018 අගෝස්තු මාසයේ සිය කටයුතු ආරම්භ කරන විට සෑම කටයුත්තක්ම බිම් මට්ටමේ සිට ආරම්භ කිරීමට සිදු විය. ක්‍රියාත්මක වීමට ස්ථානයක් නොතිබුණි, අරමුදල් සහ වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් සපයාගත යුතු විය. 2019 වර්ෂය තුළ අපට කාර්යාලය සඳහා ස්ථානයක් සොයා ගැනීමටත්, IESL සහ IIESL සාමාජිකයින් සමූහ වශයෙන් ලියාපදිංචි කිරීමටත්, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් (DMS) අනුමැතිය ලබා ගැනීමටත් හැකි විය. 2019 වසර අවසානයේ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.

2020 වසර මුලදී, මහ මැතිවරණය හේතුවෙන් සියලුම බඳවා ගැනීම් නතර කර තිබුණි. COVID-19 වසංගතය හේතුවෙන් වසරේ වැඩි කාලයක් රට වසා දමා තිබුණි. කෙසේ වෙතත්, අපට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ විශේෂ අනුමැතිය ඇතිව කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු (ICT නිලධාරි, කළමනාකරණ සහකාර සහ ICT සහකාර) බඳවා ගත හැකි විය. වරලත් ඉංජිනේරු, සහකාර ඉංජිනේරු, අනුබද්ධ ඉංජිනේරු, සංස්ථාපිත ඉංජිනේරු සහ ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් යන කාණ්ඩවල පුද්ගල ලියාපදිංචි කිරීම් සිදු කරන ලදී. 2020 වසර තුළ ලැබූ ප්‍රගතිය පහත දැක්වේ.

ඉතිහාසයේ ප්‍රථම වරට ලියාපදිංචි වූ සියලුම ඉංජිනේරු වෘත්තිකයන් සඳහා විද්‍යුත් සහතිකයක් (e-certificate) නිකුත් කරන ලද අතර, මෙය වසරේ දෙසැම්බර් 31 දක්වා වලංගු වූ අතර ඉන් අනතුරුව එය ඊලග වසර සඳහා අලුත් කළ යුතු වේ. සහතිකයේ වලංගුභාවය ECSL වෙබ් අඩවියෙන් තහවුරු කර ගත හැකි වේ. බොහෝ ආයතන බඳවා ගන්නා අවස්ථාවේදී සහතිකය ඉල්ලා සිටි බැවින් මෙය ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. එබැවින් එය ඉංජිනේරු සභාවේ ලියාපදිංචියට විශාල වටිනාකමක් ලබා දුන්නේය. තවද එය සභාවේ අරමුදල් වැඩි කිරීමට උපකාරී වන අතර භාණ්ඩාගාරයේ අරමුදල් යොදා නොගෙන සමහර වියදම් දැරීමට හැකි විය.

ඉජිනේරු සභාවේ බොහෝ කාර්යයන් මාර්ගගතව සිදු කිරීම ආරම්භ කරන ලද අතර එය බොහෝ විට රට වසා දමා තිබුණද ඕනෑම ස්ථානයක සිට වැඩ කටයුතු කිරීමට උපකාරී විය. පනතින් ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සාකච්ඡා පැවැත්විණි. ඉංජිනේරු තාක්ෂණවේදීන් ලියාපදිංචි කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ ඒකාබද්ධව මූලික කටයුතු අවසන් කර ඇත.

***

සංවිධාන ව්‍යුහය



කාර්ය මණ්ඩලය

	තනතුරු	සංඛ්‍යාව
1.	ප්‍රධාන විධායක නිලධාරී	01
2.	ලේඛකාධිකාරී	01
3.	තොරතුරු තාක්ෂණ නිලධාරී	01
4.	ගණකාධිකාරී	01
5.	තොරතුරු තාක්ෂණ සහකාර	01
6.	කලමනාකරණ සහකාර	01
7.	පෞද්ගලික සහකාර	01
8.	කාර්යාල සහායක	01

සභාව සහ සභාවේ සාමාජිකයන් පිළිබඳ කෙටි සටහන

සභාව සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 04 දෙනෙකු නිල වශයෙන් (මහාචාර්ය ධුරයට පහල ධුරයන් නොවන ඉංජිනේරු පීඨවල පීඨාධිපතිවරුන් තිදෙනෙකු සහ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්) පත්වන සාමාජිකයන් වන අතර අනෙකුත් සාමාජිකයන් 13 දෙනා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට අදාල රේඛීය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

"පත්කරනු ලබන සාමාජිකයන්" සෑම දෙවසරකට වරක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන්නා වූ විවිධ ඉංජිනේරු ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන වරළත් ඉංජිනේරුවන් හත් දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරු ආයතනය විසින් සෑම දෙවසරකට වරක් නම් කරනු ලබන විවිධ ඉංජිනෙරු ක්ෂේත්‍රයන් නියෝජනය කරන ලබන සාමාජිකයන් 04 දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය විසින් නම් කරනු ලබන වරළත් ඉංජිනේරු වරයෙකුගෙන් සහ තෘතීය හ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ඉංජිනේරු කාර්මිකයන්ගේ නියෝජිතයෙකු ගෙන් ද සමන්විත වේ.

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතරින් වරලත් ඉංජිනේරුවරුන්ගෙන් කෙනෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබයි. 2018 වර්ෂයේ අප්‍රේල් මස පත්කරනු ලැබූ සභවේ සාමාජිකයන් පහත පරිදි වේ.

අංකය	නම	සුදුසුකම්	තනතුර
1	තිලක් ද සිල්වා මහතා	*BSc Eng., MSc, CEng (SL), CEng (UK), CITP (UK), FIE (SL), FIET (UK), FBCS (UK), SMIEEE (USA),MCS (SL)*	සභාපති
2	මහාචාර්ය එන්.කේ. වික්‍රමාරච්චි	*BSc Eng., MSc, PhD, DIC, CEng, MIE (SL)*	සාමාජික (නිල බලයෙන්)
3	මහාචාර්ය පී.බී.බී.හේරත්	*BSc Eng., MEng, PhD*	සාමාජික (නිල බලයෙන්)
4	මහාචාර්ය ඒ. අත්පුතරාජා	*BSc Eng.(Hons), PhD, CEng, MIE (SL)*	සාමාජික (නිල බලයෙන්)
5	එස්.යු.කේ. රූබසිංහ	*PGDBM, PGCTM, AMIE (SL)*	සාමාජික (නිල බලයෙන්)
6	මහාචාර්ය ඒ.කේ. ජයවර්ධන	*BSc Eng.(Hons), MSc, PhD, CEng, Int PE (SL), FIE (SL), FIPM (SL), FNAS (SL), GSLID*	සාමාජික
7	ජේ. මීගොඩ මහතා	*BSc Eng.(Hons), PGD, MBA, CEng, FIE (SL), Int PE (SL), MIEEE (USA)*	සාමාජික
8	කේ.පී.අයි.යු. ධර්මපාල	*BSc Eng, CEng, FIE (SL), FICE (UK), FIE (Aust.), MASCE (USA), MSSE (SL), MACE (SL),IntPE (SL), PEng (Aust)*	සාමාජික
9	ඒ. මනම්පේරි මහතා	*BSc Eng, MS Eng, MBA, CEng, FIE (SL)*	සාමාජික
10	ජේ.ඒ.පී.ආර්. ජයලත් මහතා	*BSc Eng., MSc Eng. , MEcon, PG (Dip)IT, PG (Dip) Const Mgt. FIE (SL), FCIHT (UK), LM (IRC), CMILT, MSSE (SL)*	සාමාජික
11	ආචාර්ය ටි. ඒ .පී . ගුණසේකර	*M Eng, MSc Eng (Hons), PhD, CEng, IEng, MIE (SL), FIIE (SL)*	සාමාජික
12	ඩී.එස්. සෙනරත් මහතා	*MCGI (UK), IEng , MEG (SL), DTM (USA), FIIE (SL),*	සාමාජික

13	කේ. ආරියවංශ මහතා	GCGI (UK), MCGI (UK), IEng, MASCE (USA), MEG (SL), FIIE (SL),	සාමාජික
14	යූ.පී.පී. කවිකේශව මහතා	BSc (Hons), MCGI (UK), IEng, TEng. AIE (SL), MEG (SL),MIAENG, FIIE (SL)	සාමාජික
15	ඩී. අබේසිරිවර්ධන මහතා	BSc Eng, CEng, MIE (SL)	සාමාජික
16	වන්න විජේසේකර මහතා	IEng, FIIESL	සාමාජික
17	ආචාර්ය ආනන්ද රණසිංහ මහතා	BSc, MTech, MEng, LLM (Colombo) LLM (Wales), PhD, CEng, FIStructE (UK), FICE (UK), FIE (SL), FSSE, FCIArb, Attorney at Law	සාමාජික

කවුන්සිලයේ පළවන සැසිවාරය 2020 ඔක්තෝබර් 28 දින අවසන් වූ බැවින්. පහත සඳහන් නව සභාව 2020 ඔක්තෝබර් 29 දින සිට පත් කරන ලදී.

අංකය	නම	සුදුසුකම්	තනතුර
1	තිලක් ද සිල්වා මහතා	BSc Eng., MSc, CEng (SL), CEng (UK), CITP (UK), FIE (SL), FIET (UK), FBCS (UK), SMIEEE (USA),MCS (SL)	සභාපති
2	මහාචාර්ය එන්.කේ. වික්‍රමාරච්චි	BSc Eng., MSc, PhD, DIC, CEng, MIE (SL)	සාමාජික (නිල බලයෙන්)
3	මහාචාර්ය පී.බී.බී.හේරත්	BSc Eng., MEng, PhD	සාමාජික (නිල බලයෙන්)
4	මහාචාර්ය ඒ. අත්පුතරාජා	BSc Eng.(Hons), PhD, CEng, MIE (SL)	සාමාජික (නිල බලයෙන්)
5	එස්.යු.කේ. රූබසිංහ	PGDBM, PGCTM, AMIE (SL)	සාමාජික (නිල බලයෙන්)
6	ජේ. මීගොඩ මහතා	BSc Eng.(Hons), PGD, MBA, CEng, FIE (SL), Int PE (SL), MIEEE (USA)	සාමාජික
7	කේ.පී.අයි.යු. ධර්මපාල	BSc Eng, CEng, FIE (SL), FICE (UK), FIE (Aust.), MASCE (USA), MSSE (SL), MACE (SL),IntPE (SL), PEng (Aust)	සාමාජික
8	ඒ. මනම්පේරි මහතා	BSc Eng, MS Eng, MBA, CEng, FIE (SL)	සාමාජික
9	ජේ.ඒ.පී.ආර්. ජයලත් මහතා	BSc Eng., MSc Eng. , MEcon, PG (Dip)IT, PG (Dip) Const Mgt. FIE (SL), FCIHT (UK), LM (IRC), CMILT, MSSE (SL)	සාමාජික
10	ආචාර්ය ටි. ඒ .පී . ගුණසේකර	M Eng, MSc Eng (Hons), PhD, CEng, IEng, MIE (SL), FIIE (SL)	සාමාජික
11	ඩී.එස්. සෙනරත් මහතා	MCGI (UK), IEng , MEG (SL), DTM (USA), FIIE (SL),	සාමාජික
12	කේ. ආරියවංශ මහතා	GCGI (UK), MCGI (UK), IEng, MASCE (USA), MEG (SL), FIIE (SL),	සාමාජික
13	යූ.පී.පී. කවිකේශව මහතා	BSc (Hons), MCGI (UK), IEng, TEng. AIE (SL), MEG (SL),MIAENG, FIIE (SL)	සාමාජික
14	ඩී. අබේසිරිවර්ධන මහතා	BSc Eng, CEng, MIE (SL)	සාමාජික
15	ආචාර්ය ආනන්ද රණසිංහ මහතා	BSc, MTech, MEng, LLM (Colombo) LLM (Wales), PhD, CEng, FIStructE (UK), FICE (UK), FIE (SL), FSSE, FCIArb, Attorney at Law	සාමාජික
16	කෝසල කඹුරාදෙනිය මහතා	BSc Eng, PG Dip (Ind. Eng), MBA, Dip (Com. Arb), Attorney-at-Law, CEng, FIE (SL), IntPE (SL), MIET, MIEEE, MASHRAE	සාමාජික

සම්පූර්ණ කරන ලද සහ දැනට සිදු කරමින් පවතින කාර්යයන්

සම්පූර්ණ කර ඇති කාර්යයන්.

1. ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

2020 වර්ෂයේ ලියාපදිංචි වෘත්තිකයන්ගේ විස්තර පහත දැක්වේ.

➢	වරලත් ඉංජිනේරු	- 5,166
➢	ආශ්‍රිත ඉංජිනේරු	- 9,431
➢	අනුබද්ධ ඉංජිනේරු	- 116
➢	සංස්ථාගත ඉංජිනේරු	- 447
➢	ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්	- 598
	මුළු ලියාපදිංචි කිරීම් ගණන	- 15,758

2. සභා රැස්වීම්

පහත සඳහන් දිනයන්හි ඉංජිනේරු සභාවේ රැස්වීම් පවත්වන ලදී.

2020 ජනවාරි 09	2020 ජූලි 09
2020 පෙබරවාරි 13	2020 අගෝස්තු 13
2020 මාර්තු 12	2020 සැප්තැම්බර් 10
2020 අප්‍රියෙල් 09	2020 ඔක්තෝබර් 08
2020 මැයි 14	2020 නොවැම්බර්12
2020 ජූනි 11	2020 දෙසැම්බර් 10

3. සහතික නිකුත් කිරීම

ECSL හි ලියාපදිංචි වූ සෑම ඉංජිනේරු වෘත්තිකයෙකුටම වාර්ෂිකව ඉලෙක්ට්‍රොනික සහතිකයක් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. සහතිකය එම වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වලංගු වන අතර ලියාපදිංචිය අලුත් කිරීමෙන් පසු සෑම වසරකම නව සහතිකයක් නිකුත් කරනු ලැබේ. එසේම, සහතිකයේ වලංගුභාවය www.ecsl.lk වෙබ් අඩවියෙන් පරීක්ෂා කළ හැකිය. ශ්‍රී ලංකාවේ මෙවැනි සහතිකයක් මාර්ගගත (Online) සත්‍යාපනයක් සහිතව නිකුත් කරන පළමු අවස්ථාව මෙයයි. මෙය ECSL හි විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

4. දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම

ලියාපදිංචි ඉංජිනේරු වෘත්තිකයන්ගේ දත්ත පද්ධතිය ඉලෙක්ට්‍රොනික සහතික සත්‍යාපනය වැනි නව විශේෂාංග සමඟින් වැඩි දියුණු කරන ලදී.

5. වෙබ් අඩවිය නවීකරණය කිරීම

ECSL වෙබ් අඩවිය වඩාත් තොරතුරු සහ පරිශීලක-හිතකාමී කිරීමට වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී.

6. දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම

ECSL හි කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගුවන් විදුලි වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

7. වෙනත් සංවිධාන සමඟ රැස්වීම් පැවැත්වීම

ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා කරුණු සාකච්ඡා කිරීමට විවිධ සංවිධාන සමඟ පහත සඳහන් රැස්වීම් පවත්වන ලදී.

i. 2020 ජුනි 29 වන දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ රැස්වීම.

ii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) සමඟ රැස්වීම.

iii. 2020 ජනවාරි 02 වන දින ඉංජිනේරු ආයතනයේ (IESL) රැස්වීම.

iv. 2020 ජනවාරි 16 වැනි දින සංස්ථාගත ඉංජිනේරු ආයතනය (IIESL) සමඟ රැස්වීම.

v. 2020 මාර්තු 13 වැනි දින IET, IMechE සහ ICE හි නියෝජිතයන් සමඟ රැස්වීම.

vi. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ (UGC) සභාපති සමඟ හමුවක්.

vii. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ (CIDA) නියෝජිතයන් සමඟ රැස්වීම.

viii. 2020 අගෝස්තු 28 දින රාජ්‍ය සේවා ඉංජිනේරු සංගමය (PSEA) සමඟ රැස්වීම.

ix. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) නිලධාරීන් සමඟ රැස්වීම.

x. විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ හමුවක්.

8. 2020 ඔක්තෝබර් 20 දිනැති අංක:2198/9 අතිරේක සාමාන්‍ය ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම.
ගැසට් පත්‍රයෙහි අඩංගු වන්නේ:

i. ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම

ii. ලියාපදිංචිය සඳහා වන අයදුම්පත් පරීක්ෂා කිරීමට අක්තපත්‍ර කමිටුව

iii. ලියාපදිංචිය සඳහා වාර්ෂික ගාස්තුව

iv. ලියාපදිංචි වූ සෑම ඉංජිනේරු වෘත්තිකයෙකුටම ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම

v. ඉංජිනේරු වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත

vi. විදේශීය ඉංජිනේරු වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත

vii. රෙජිස්ටර් සහ මුද්‍රා නඩත්තු කිරීම

viii. නීති

ix. ඉංජිනේරු වෘත්තිකයන් සඳහා වෘත්තීය හැසිරීම් සංග්‍රහය

දැනට සිදු කරමින් පවතින කටයුතු

1. ඉතිරි නීති සහ රෙගුලාසි සකස් කිරීම
2. ඉංජිනේරු කාර්මිකයින් ලියාපදිංචිය සඳහා ක්‍රියාවලිය සකස් කිරීම

මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන අංක	2020 රු. '000	2019 රු . '000
මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම	01	15,757	17,033
භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන		800	3,548
පොලී ආදායම	02	1,008	
මුළු අදායම		17,565	20,581
පරිපාලන වියදම්	3.1	(5,938)	(2,805)
ගිවිසුම් ගත සේවා සහ නඩත්තු වියදම්	3.2	(659)	(454)
වෙනත් මෙහෙයුම් වියදම්	3.3	(633)	(2,625)
ක්ෂය වීම		(52)	
මුළු වියදම		(7.282)	(5,884)
මෙහෙයුම් වලින් අතිරික්තය/ (ඌනතාව)		10,283	14,697
බදු		(1,329)	(1,086)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව)		8,954	13,611

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන අංක	2020 රු. '000	2019 රු . '000
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	04	2,235	2,038
මුදල් හා මුදල් සමාන දෑ -කෙටි කාලින	05	20,008	14,000
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	06	1,194	3,731
පූර්ව ගෙවීම්	07	23	30
		23,460	19,799
ජංගම නොවන වත්කම්			
දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	08	3,036	3,036
මුළු වත්කම්		26,496	22,835
			-
වගකීම්			-
ජංගම වගකීම්			
අනෙකුත් ප්‍රතිපාදන හා ගෙවිය යුතු දෑ	09	1,523	6,188
ජංගම නොවන වගකීම්			
විලම්බිත අදායම (රජයේ ප්‍රදාන සඳහා)	10	2,408	3,036
මුළු වගකීම්		3,931	9,224
ශුද්ධ වත්කම්		22,565	13,611

ශුද්ධ වත්කම්/ හිමිකම් ප්‍රාග්ධනය හා සංචිත			
දායක ප්‍රාග්ධනය	11		
සමුච්චිත ලාභය / (ඌනතාව)	12	22,565	13,611
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		22,565	13,611

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 05 සිට 12 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ.

ඉංජිනේරු සභාවේ පවතින වාර්තා අනුව ඉහත මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ නිවැරදි බවට සහතික කරමි.

අත්සන් කළේ

පී. ඒ. පී. සිල්වා

ගණකාධිකාරී (වැඩ බලන)

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකිව යුතුයි. ඉංජිනේරු සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

අත්සන් කළේ

ඉංජිනේරු තිලක් ද සිල්වා

සභාපති

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව

ඉංජිනේරු ඩී. එස්. සෙනරත්

සභාවේ සාමාජික

2021 අප්‍රේල් 08

ශුද්ධ වත්කම්/කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 දිනට

සටහන: 12	දායකත්ව ප්‍රාග්ධනය රුපියල් 000	සමුච්චිත ලාභය/හිඟය රුපියල් 000	මුළු අගය රුපියල් 000
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය **B/F**	-	-	-
කාල සීමාව සඳහා අතිරික්තය / (ඌනතාවය)		13,611	13,611
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	13,611	13,611
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය B/F		13,611	13,611
කාල සීමාව සඳහා අතිරික්තය / (ඌනතාවය)		8,954	8,954
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය B/F	-	22,565	22,565

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020 රුපියල් 000		2019 රුපියල් 000	
මෙහෙයුම් කටයුතුවලින් වලින් ලද මුදල් ප්‍රවාහ				
භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) වලට පෙර වර්ෂයේ අතිරික්ත (ඌනතාව)		8,154		11,149
එකතු කල: ලැබුණු හා භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන)		800		3,548
එකතු කල: ක්ෂය වීම		52		-
වර්ෂයේ බදු අඩු කිරීමට පෙර අතිරික්ත/(ඌනතාව)		9,006		14,697
මුදල් නොවන සංචලන				
ගෙවිය යුතු මුදල් අඩු වීම	(4,665)		5,102	
අනෙකුත් ජංගම වත්කම්වල පහල යාම	2,545	(2,120)	(3,761)	1,341
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහ		6,886		16,038
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ				
දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ මිලදී ගැනීම	(681)		(3,140)	
ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		(681)		(3,140)
මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ				
රජයේ ප්‍රදාන (දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රාග්ධනය)	-		3,140	
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		-		3,140
මුදල් හා මුදල් සමාන දෑ අගයන්හි ශුද්ධ වැඩිවීම/ අඩුවීම		6,205		16,038
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		16,038		-
කාල සීමාව අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		22,243		16,038

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

01. මුදල් සහ මුදල් සමාන දෑ බැංකු සමඟ ශේෂ වලින් සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් මුදල් සහ මුදල් සමාන දෑ පහත සඳහන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශන වලින් සමන්විත වේ.

	2020	2019
	රු. '000	රු. '000
බැංකුවේ ජංගම ගිණුමේ ශේෂය(සටහන අංක 04)	2235	2038
ආයෝජන- ස්ථාවර තැන්පතු (කෙටි කාලීන) (සටහන අංක 05)	20,008	14,000
	22,243	16,038

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම

	2020 රු. '000	2019 රු. '000
සටහන අංකः 01 ලියාපදිංචි කිරීමේ ගාස්තු		
වරළත් ඉංජිනේරුවන්	4,906	5,409
ආශ්‍රිත ඉංජිනේරුවන්	9,716	10,491
අනුබද්ධ ඉංජිනේරුවන්	91	129
සංස්ථාගත ඉංජිනේරුවන්	446	410
ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්	598	594
එකතුව	15,757	17,033
සටහන අංකः 02 පොලී ආදායම		
පොලී ආදායම:ලංකා බැංකුව,ගිණුම් අංක 85326186	224	
පොලී ආදායම:ලංකා බැංකුව,ගිණුම් අංක 86301038	63	
පොලී ආදායම:ලංකා බැංකුව,ගිණුම් අංක 85326167	721	
එකතුව	1,008	
වියදම්		
සටහන් අංකः 3.1 පරිපාලන පිරිවැය		
වැටුප් සහ වේතන	2,466	918
සභාවේ සාමාජිකයන්ගේ දීමනා	3,472	1,887
එකතුව	5,938	2,805
සටහන අංකः 3.2 ගිවිසුම් ගත සේවා සහ නඩත්තු වියදම්		
තැපැල් හා දුරකථන ගාස්තු	289	18
තොරතුරු තාක්ෂණ වියදම්	114	165
සංග්‍රහ	92	68
විගණන ගාස්තු	75	75
මුද්‍රණ කටයුතු	10	34
උපදේශන ගාස්තු	52	49
විවිධ වියදම්	-	33
කාර්යාල උපකරණ නඩත්තු කිරීම	27	12
එකතුව	659	454

<u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් තවදුරටත්</u>

සටහන අංකː 3.3 වෙනත් මෙහෙයුම් වියදම්		
ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	30	3
වාර සඟරා සහ පුවත්පත්	286	600
බැංකු ගාස්තු	13	3
පොලී ගෙවීම්	-	3
වෙනත් මෙහෙයුම් වියදම්	88	2,016
වෙළඳ දැන්වීම් වියදම්		
ගමන් සහ ප්‍රවාහන	22	
ජල	24	
වෙබ් අඩවිය වැඩි දියුණු කිරිම	170	
එකතුව	633	2,625
ක්ෂය වීම	52	
මුළු එකතුව	7,282	5,884

	2020 රු. ‘000	2019 රු. ‘000
සටහන අංකː 04 මුදල් සහ මුදල් සමාන දෑ		
(1) ලංකා බැංකුව (නිදහස් චතුරස්‍රය)(ජංගම ගිණුම් අංක 83585687)	(1871)	1,570
(2) ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය)(ජංගම ගිණුම් අංක 83591633)	4,091	453
(3) අත් මුදල්	15	15
මුළු එකතුව	2,235	2,038
සටහන් අංකː 05 මුදල් හා මුදල් සමාන දෑ - ආයෝජන (කෙටිකාලීන)		
(1) ස්ථාවර තැන්පතු-ලංකා බැංකුව(නිදහස් චතුරශ්‍රය) 85326167	10, 721	10, 000
(2) ස්ථාවර තැන්පතු-ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) 83301038	5,063	4,000
(3) ස්ථාවර තැන්පතු-ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍රය) 85326186	4,224	
මුළු එකතුව	20,008	14,000

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (තවදුරටත්)

	2020 රු. '000	2019 රු. '000
සටහන් අංකः 06 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ		
ලැබිය යුතු ලියාපදිංචි ගාස්තු	943	3,731
ලැබිය යුතු වැට් බදු (ගෙවීම් ඉක්මවූ)	250	
	1,194	3,731
සටහන් අංකः 07 පූර්ව ගෙවීම්		
තොරතුරු තාක්ෂණ වියදම්	-	30
ජල තැන්පතු	3	-
සේවක අර්ථසාධක අරමුදල	17	-
සේවක භාර අරමුදල	3	-
මුළු එකතුව	23	30
සටහන අංකः 09 වෙනත් ප්‍රතිපාදන සහ ගෙවිය යුතු දේ		
(1) විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	150	75
(2) ගෙවිය යුතු PAYE බදු	18	17
(3) වෙනත් ගෙවීම්	26	7
(4) ආදායම් බදු ගෙවීම්	1, 329	1, 086
(5) වැට් බදු ගෙවීම්	-	1,549
(6) අත්තිකාරම් වශයෙන් ලැබූ ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	3,454
මුළු එකතුව	1,523	6,188

දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

සටහන අංකः 08

පිරිවැය	2020.01.01 දිනට ශේෂය රු. '000	එකතු කිරීම් රු. '000	බැහැර කිරීම් /ගැලවීම් රු. '000	2020.12.31 දිනට ශේෂය රු. '000
ගෘහභාණ්ඩ හා	3,041			3,041
කාර්යාල උපකරණ		108		108
පරිගණක සහ උපාංග	99	574		673
මුළු එකතුව	3,140	682		3,822
ක්ෂය වීම්	2020.01.01 දිනට ශේෂය රු. '000	එකතු කිරීම් රු. '000	බැහැර කිරීම් /ගැලවීම් රු. '000	2020.12.31 දිනට ශේෂය රු. '000
ගෘහ භාණ්ඩ	101	608		709
කාර්යාල උපකරණ		5		5
පරිගණක සහ උපංග	3	68		71
මුළු එකතුව	104	681		785
පොත් වල ශුද්ධ වටිනාකම	3036			3036

මූල්‍ය කාර්ය සාධනය සඳහා ක්ෂයවීම් ගාස්තු පහත පරිදි සිදු කෙරේ.

ක්ෂයවීම්	වසර සඳහා ගාස්තු රු. '000	වර්ෂය තුළ විලම්බිත ආදායම රු. '000	අනාවරණය කළ මුදල රු. '000
ගෘහ භාණ්ඩ හා උපාංග	608	608	0
කාර්යාලීය උපකරණ	5		5
පරිගණක හා උපාංග	67	20	47
මුළු එකතුව	680	628	52

සටහන අංක: 10

කල් දැමූ ආදායම	202-01-01 දිනට ශේෂය රු. '000	වර්ෂය තුළ එකතු කිරීම රු. '000	වර්ෂය සඳහා ගාස්තු		2020.12.31 දිනට ශේෂය රු. '000
			ක්ෂය වීම් රු. '000	නැවත ඇගයීම් ගැලපීම් / බැහැර කිරීම රු. '000	
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	2940		(608)		2,332
පරිගණක හා උපාංග	96		(20)		76
මුළු එකතුව	3036	-	(628)		2408

විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ආර්/ඒ/ඊසීඑස්එල්/ එෆ්ඒ/2020	ඔබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2021 දෙසැම්බර් 31 දින

සභාපති

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව.

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනත	
(i) පනතේ 12 ඡේදය	ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව යම් කාරණා පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් කරනු ලබන වැරදි නියාමනය කිරීම සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ii) පනතේ 14 වන ඡේදයේ 15 වන හා 18 වන වගන්ති	ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස එම ඉංජිනේරු වෘත්තිකයා ඉංජිනේරු වෘත්තිය සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) වෘත්තිකයින් පිළිවෙලින් 20,248 ක් හා 8,000 ක් වුවද ඉංජිනේරු සභාවේ වෘත්තිකයින් 17,757 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ සම්බන්ධව සම්බන්ධිත පාර්ශවය දැනුවත් කිරීම හා ලියාපදිංචිවීමකින් තොරව ඉංජිනේරු වෘත්තියේ නියැලෙන පුද්ගලයින් හඳුනා ගැනීමට හැකි යාන්ත්‍රනයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii)	පනතේ 25 ඡේදය	රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙම පනතේ විධිවිධානවලට සහ මේ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව පනතේ "ආ" උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලේඛණයන් පවත්වාගෙන යා යුතු වුවද ඉංජිනේරු සභාව මගින් පවත්වාගෙන යනු ලබන සාමාජික නාමලේඛණයේ ඉහත ආකෘතියේ සදහන් පරිදි සාමාජිකයින්ගේ ලිපිනය, ලියාපදිංචි වූ දිනය හා ලියාපදිංචි ගාස්තුව ඇතුලත්ව නොතිබුණි.
(iv)	පනතේ 41 වන ඡේදය	ඉංජිනේරු වෘත්තිකයන් ඛාණ්ඩ 06 ක් යටතේ ලියාපදිංචි කිරීමට ඉංජිනේරු සභාව කටයුතු කළ යුතු වුවද ඒ යටතට ගැනෙන ඉංජිනේරු කාර්මිකයින් සභාවේ ලියාපදිංචි කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.
(v)	පනතේ බලතල (එ)	ඉංජිනේරු වෘතිත්කයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබද ක්‍රියා පටිපාටියක් තීරණය කළ යුතු වුවද එසේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු අකාරය මෙතෙක් නිශ්වය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 396 (ඇ)	නිකුත් කර මාස 06 ඉක්මවූ නමුත් ගෙවීම සදහා ඉදිරිපත් නොකළ චෙක්පත්

		සම්බන්ධයෙන් අදායකයා විමසා රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවද වටිනාකම රු.10,557 ක් වූ චෙක්පත් 2 සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	**2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**	
(i)	චක්‍රලේඛයේ 5 වන පර්වච්ඡේදයේ 5.1.1 හා 5.1.3 වගන්තිය	සභාවට අදාළ වන පරිදි අවම වශයෙන් අවුරුදු 03 ක කාලපරිච්ඡේදයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැසුම් සකස් කළ යුතුය. තවද සකස් කරන ලද සංයුක්ත හා ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර එසේ අනුමත කරන ලද සංයුක්ත හා ක්‍රියාකාරී සැලසුම් හි පිටපත් වාර්ෂික අයවැය වාර්තාව සමග එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.
(ii)	5 වන පරිච්ඡේදයේ 5.2.3 හා 5.2.4 ඡේදය	සභාව විසින් වාර්ෂික අයවැය වාර්තාවක් අදාළ වර්ෂය ආරම්භ වීමට මාස 06 කට පෙර පිළියෙල කර අදාළ වර්ෂය ආරම්භයට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමත කර ගත යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii) 7.4.5 ඡේදය

සෑම වර්ෂයක් අවසානයටම ස්ථාවර වත්කම් හා ගබඩා තොග සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද 2020 වර්ෂය අවසානයට එසේ ගබඩා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

විධිමත් ගිවිසුමකින් තොරව ඉංජිනේරු සභාවේ ප්‍රධාන කාර්යාලය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිශ්‍රය තුළ පවත්වාගෙන ගිය ද ඉංජිනේරු සභාවේ කාර්යාලය බෙදා වෙන් කිරීමේ කටයුතු සඳහා (Partitions) රු.437,350 ක් වැය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති